59

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මානවශාස්ත්‍ර හා සමාජයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී උපාධි දෙවන වසර ප්‍රථම අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2018 අගෝස්තු/සැප්තැම්බර්

ආර්ථික විද්‍යාව

**ECON 2120.03 – ආර්ථික චින්තනයේ විකාශය**

කාලය පැය (03) තුනයි

---

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. (අ) පහත දක්වා ඇති එක් එක් විද්වතා (Scholar) විසින් රචනා කරන ලද එක් ග්‍රන්ථයක් බැගින් නම් කරන්න.

(i) ප්ලේටෝ

(ii) ඇරිස්ටෝටල්

(iii) ෂෙනොෆොන්

(iv) සාන්ත තෝමස් ඇක්වයිනාස්

(v) නිකොලස් කොපර්නිකස්

(vi) ඉබ්න් කල්දූම්

(vii) මාර්ටින් ලූතර්

(viii) කෞටිල්‍යා

**(එක් කොටසකට ලකුණු 01 බැගින් ලකුණු 08 යි)**

(ආ) ඉහත දක්වා ඇති විද්වතුන් අතුරින් ඕනෑම සිව්දෙනෙකු පිළිබඳ කෙටි සටහන් ලියන්න.

**(එක් කොටසකට ලකුණු 02 බැගින් ලකුණු 08 යි)**

02. වාණිජවාදයේ පුරෝගාමීන් නම් කොට වාණිජවාදයේ ප්‍රධාන ආර්ථික අදහස් විවේචනාත්මක විමසන්න.

**(ලකුණු 16 යි)**

03. (i) 'පිසියෙවාක්‍රැට්වාදය ස්වභාව ධර්මයේ නීතිය (rule of nature) අවධාරණය කරයි'. මෙම ප්‍රකාශය පැහැදිලි කොට සාකච්ඡා කරන්න

(ලකුණු 06 යි)

(ii) ක්වෙස්නේගේ ආර්ථික සටහනෙහි වැදගත්කම පැහැදිලි කරන්න

(ලකුණු 10 යි)

04. පහත දක්වා ඇති එක් එක් කරුණ සම්බන්ධයෙන් සම්භාව්‍ය ආර්ථික විද්‍යාඥයන්ගේ ප්‍රධාන අදහස් සාකච්ඡා කරන්න.

(i) ආර්ථික දර්ශනය
(ii) ආර්ථික ප්‍රතිපත්තිය
(iii) ආර්ථික වර්ධනය
(iv) ජනගහනය

**(එක් කොටසකට ලකුණු 04 බැගින් ලකුණු 16 යි)**

05. (i) මාක්ස්ට අනුව ධනවාදයේ ගති ලක්ෂණ (characteristic features) කවරේද?

(ලකුණු 08 යි)

(ii) 'ධනවාදී ආර්ථික ක්‍රමයක ශ්‍රමය අතිරික්ත වටිනාකමක් බිහි කරයි'. මෙම ප්‍රකාශයට ඔබ එකඟවන්නෙහිද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 08 යි)

06. ආර්ථික න්‍යාය වැඩි දියුණු කිරීමෙහිලා නව සම්භාව්‍ය ආර්ථික විද්‍යාඥයන්ගේ දායකත්වය පැහැදිලි කරන්න.

(ලකුණු 16 යි)

07. කේන්සියානු ආර්ථික විද්‍යාවේ ප්‍රධාන අදහස් විවේචනාත්මකව විමසන්න.

(ලකුණු 16 යි)

08. පහත දැක්වෙන මාතෘකා අතුරින් ඕනෑම **හතරක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ජර්මන් ඓතිහාසික ගුරුකුලය
(ii) පශ්චාද් කේන්සියානු ගුරුකුලය
(iii) තෝර්ස්ටීන් වෙබ්ලන්
(iv) මනෝරාජික සමාජවාදීන්
(v) තාර්කික අපේක්ෂණ

**(එක් කොටසකට ලකුණු 04 බැගින් ලකුණු 16 යි)**

*************